සියලුම හිමිකම් ඇවිරිණි.
*All Rights Reserved*

# අවසාන වාර පරීක්ෂණය 2015

# පෙරදිග සංගීතය

**11 ශ්‍රේණිය** **කාලය පැය 2 යි. වි. 30 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**

---

01. නි ධ ම | ප ගු රි | ස රි ගු | ම ප | යනුවෙන් ඇරඹෙන්නේ කුමන රාගයකට අයත් සර්ගමයක් ද?
(1) කාෆි (2) භීමපලාශ්‍රී (3) භෛරවී (4) යමන්

02. භීමපලාශ්‍රී සහ කාෆි යන රාග දෙකටම පොදු සමානකම කුමක් ද?
(1) රාග දෙකේම වාදි සංවාදි සමාන වේ.
(2) රාග දෙකම සම්පූර්ණ ජාති වේ.
(3) රාග දෙකේම ආරෝහණ අවරෝහණ සමාන වේ.
(4) රාග දෙකේම ග, නි ස්වර කෝමල වේ.

03. රාගයකට අදාළ වාදි සංවාදි, ස්වර සංගති, ගානසමය ආදිය කියවෙන අන්දමින් ප්‍රබන්ධවී ඇත්තේ,
(1) තානාලංකාර (2) සර්ගම්
(3) ලක්ෂණ ගී (4) මේල නොහොත් ඨාට

04. සප්තකයේ ස්වර පිහිටීම අනුව මෙහි ඇති වැරදි තොරතුරු තෝරන්න.
(1) 'ග' සහ 'ම' අතර අර්ධ ස්වරයක් ඇත. (2) 'ධ' සහ 'නි' අතර අර්ධ ස්වරයක් ඇත.
(3) ම සහ ප අතර අර්ධ ස්වරයක් ඇත. (4) 'ස' සහ 'රි' අතර අර්ධ ස්වරයක් ඇත.

05. ''තැන් තැන්වලම ලැගි සත්තන් මුවන් රැළ'' මෙම නාට්‍ය ගීතය සඳහා පාදක වී ඇති රාගය වන්නේ,
(1) භෛරවී (2) යමන් (3) කාෆී (4) බිලාවල්

06. මධ්‍ය 'ස' ස්වරයට වඩා උච්ච ස ස්වරයේ හඬ ඉහළ වනුයේ,
(1) විස්තාරය විශාල නිසාය. (2) පෙළීමේ බර වැඩි නිසාය.
(3) විපුලතාවය වැඩි නිසාය. (4) සංඛ්‍යාතය වැඩි නිසාය.

07. අර්ධ ශෛලිගත වර්ගයට අයත් නාට්‍ය සමූහය තෝරන්න.
(1) මනමේ, සිංහබාහු, හුණුවටය (2) බෙරහඬ, මනමේ, කැලණි පාලම
(3) නරිබෑනා, බෙරහඬ, මී පුර වැසියෝ (4) නරිබෑනා, මනමේ, තාරාවෝ ඉගිලෙති

08. කෝකිල වන්නම ගැයෙන තාල රූපයක් වන්නේ මින් කුමක් ද?
(1) සුළු මහ දෙතිත (2) දෙසුළු මැදුම් තුන් තිත
(3) සුළු මැදුම් දෙතිත (4) මැදුම් මහ දෙතිත

09. අපරදිග සංගීත ප්‍රස්තාර කරණයේ Trable Clef හි රේඛා මත සටහන් කරන ස්වර පිළිවෙලින් ලියන්න.
(1) EGBDF (2) FACE (3) ACEG (4) GBDFA

10. ගුප මුග මුරි සු | ගප ධනි සනි ධප | මග මරි සරි ස | ගරි ගප ධනි ස මෙහි සඳහන් වනුයේ,
(1) සපට් තානයකි. (2) අලංකාරික තානයකි. (3) බෝල් තානයකි. (4) මිශ්‍ර තාන් එකකි.

- **අංක 11 - 15 දක්වා වූ ප්‍රශ්න වලට පිළිතුරු පහත වගුව ඇසුරෙන් සපයන්න.**

| | A | B | C |
|---|---|---|---|
| අ. | ඉපල් පිටින් ගහන අච්ච | පුන්මදාරා මල් දමින් මුදු | තැන් තැන් වලම ලැගි |
| ආ. | වෙල් යායක ගොන් දෙන්නෙක් | සේවිත පාද සරෝරුහ | අන්න බලන් සඳ |
| ඉ. | මේ කාගේදෝ කමතා | වරමති සුභ චරිතේ | දුලා නෙතු පුලා |

11. අනාඝාතාත්මක ගැමි ගී පාදය අයත් කොටස සටහන් වන්නේ,
(1) B අ (2) A ආ (3) C ඉ (4) B ආ

12. මද්දලය තාල වාදනය සඳහා යොදා ගනු ලබන ගායන විශේෂය අයත් වන්නේ,
(1) B ඉ (2) C ආ (3) C ඉ (4) B ආ

13. පහතරට ප්‍රදේශයට ආවේනික ගායන විශේෂය අයත් කොටස වන්නේ,
(1) A අ (2) B ආ (3) C අ (4) B ඉ

14. ගුත්තිල කාව්‍යයට අයත් සේ ගීය අයත් වන්නේ,
(1) B අ (2) A අ (3) C අ (4) B ආ


15. C 'අ' කොටසෙහි ගී පාදය හා සම්බන්ධ නාට්‍ය වනුයේ,
(1) මනමේ (2) කුවේනි
(3) කුණ්ඩලකේසී (4) පේමතෝ ජායතී ශෝකෝ

16. රේඛාව චිත්‍රපටය සම්බන්ධයෙන් නිවැරදි නොවන ප්‍රකාශය තෝරන්න.
(1) සංගීත අධ්‍යක්ෂණය ඩබ්.ඩී. අමරදේවයන් සිදුකර ඇතිබව.
(2) සිංහල චිත්‍රපට ගීතවල සිංහල ලකුණ සටහන් වූයේ මෙහි ගීතවල බව.
(3) සුනිල් ශාන්ත මහතා ගීත තනු නිර්මාණය කර ඇති බව.
(4) චිත්‍රපටයේ විරිදු පංතියක්ද ඇතුලත්ව ඇති බව.

17. පහතරට සිංදු වන්නම් සඳහා සුවිශේෂී අංගයකි,
(1) කලාසම (2) අඩව්ව (3) ඉරට්ටිය (4) සීරුමාරුව

18. ''රසාතානි'', ''මසීත්කානි'' යනුවෙන් වාදන ක්‍රම 02 ක් දක්නා ලැබෙන සංගීත භාණ්ඩය වන්නේ,
(1) සිතාරය (2) වයලීනය (3) එස්රාජය (4) බටනලාව

19. බටහිර සමාඝාත (Percussion) භාණ්ඩ වල නිදසුනකි,
(1) ක්ලැරිනට් (2) ත්‍රෝම්බෝන් (3) වියෝලා (4) ග්ලොකන්ස්පීල්

20. 
මෙම බටහිර ප්‍රස්තාරයේ දක්වා ඇති පෙරදිග ස්වරය වන්නේ,
(1) නි (2) නි̲
(3) නි̣ (4) නි̲̣

21. මාත්‍රා 3, 4 ආදී වශයෙන් විභාග වෙන්වන තිත නම් කෙරෙනුයේ,
(1) සුළු මැදුම් දෙතිත (2) සුළු මහ දෙතිත (3) මැදුම් මහ දෙතිත (4) මැදුම් තනි තිත

22. ජෙංගත් ජෙංගත් ජෙං ජෙං තා යන පද වැයීමට සුදුසු වන්නේ,
(1) ගැටබෙරයයි. (2) දවුලයි. (3) තබ්ලාවයි. (4) තම්මැට්ටමයි.

23. ඩොටඩ් ක්වෙවර් හඳුන්වන සංකේතය තෝරන්න.
(1)  (2)  (3)  (4) 

24. නාඩගම් ගී සඳහා විශේෂිත වූ සංගීතාංගයකි,
(1) දොහොරාව (2) අඩව්ව (3) උරුට්ටුව (4) මුදුප්පද

25. ගැමි ගීයක් හා සේ ගීයක් පිළිවෙලින් දක්වෙන්නේ,
(1) මන්දාරමට උඩ ඉගිලෙන තුරුරත්න සිරි ලෙසිනා
(2) වරමති සුහ චරිතේ රූ රුසේ අඳිනා ලෙසේ
(3) සාර සදිසි පෙති පේර ඉරට ඔබිය ඉර මුදුනේ
(4) පැහැ සරණිය මිණි පැමිණිය රැගත් සුරා පිරූ විතින්

26. මාතලන් චිත්‍රපටයේ ඇතුලත් ගීතයක් නොවන්නේ,
(1) රන්වන් දූල් කරලින් පැසිලා (2) ඉවසනු හඳේ
(3) උපත ලබා මේ ලොකේ (4) සාගර හිමිය සොයා


27. මන්ද්‍ර සු, මධ්‍ය ස, උච්ච සී යන ස්වර තුනෙහි කම්පන වාර සංඛ්‍යාතයන් පිළිවෙලින් ඇති පිළිතුර තෝරන්න.
(1) 132 264 528 (2) 128 256 512 (3) 120 240 480 (4) 124 248 490

28. ශ්‍රී ලංකාවේ ජාතික ගීය කිනම් තාලයකට අනුව ගායනාවේ ද?
(1) බෙම්ටෝ (2) ජප් (3) කෙහෙර්වා (4) දාදරා

29. අවශ්‍යයෙන් ගැයෙන ගීය කුමක්දැයි තෝරන්න.
(1) ඇසේ මධුර ජීවනයේ ගීතා (2) වඳිමු සුගත ශාක්‍ය සිංහ
(3) සසර වසන තුරු (4) සැලලිහිණි කොවුල් හඬ

30. විශාරද එඩ්වඩ් ජයකොඩි මහතා විසින් ගායනා කළ ''මාරම්බරී'' ගීතය,
(1) ගසල් ශෛලීය ආශ්‍රිත ගීතයකි. (2) කව්වාලි ශෛලීය ආශ්‍රිත ගීතයකි.
(3) භජන් ශෛලීය ආශ්‍රිත ගීතයකි. (4) තූර්ති ශෛලීය ආශ්‍රිත ගීතයකි.

- **පහත සඳහන් රූප සටහන ඇසුරෙන් 31 - 33 දක්වා වූ ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.**




31. රූපසටහනෙහි අංක 1, 5, 8 එකතුවෙන් නිර්මාණය වන කෝඩ් එක කුමක් ද?
(1) F Major (2) C Major (3) G Major (4) $B^b$ Major

32. අංක 6, 10, 1 එකතුවෙන් නිර්මාණය වන කෝඩ් එක කුමක් ද?
(1) F Major (2) C Major (3) G Major (4) $B^b$ Major

33. අංක 8, 12, 3 එකතුවෙන් නිර්මාණය වන කෝඩ් එක කුමක් ද?
(1) F Major (2) C Major (3) G Major (4) $B^b$ Major

34. සබරගමු හා උඩරට නර්තන සම්ප්‍රදායන්ට අයත් ප්‍රධාන අවනද්ධ භාණ්ඩ වන්නේ පිළිවෙලින්,
(1) දවුල හා යක්බෙරය (2) මද්දලය හා ගැටබෙරය
(3) ගැටබෙරය හා දවුල (4) දවුල හා ගැටබෙරය

35. මයික්‍රෆෝනය යනු ශබ්දය,
(1) ග්‍රහණය කර ගන්නා උපකරණයකි. (2) විචිත්‍රවත් ගන්නා උපකරණයකි.
(3) ඈතට විහිදුවා හරින උපකරණයකි. (4) දෝංකාරය උපදවන උපකරණයකි.

36. කෝලම් රංග සම්ප්‍රදායට ප්‍රචලිත ප්‍රදේශ වන්නේ,
(1) උඩරට සතර කෝරළයේ ප්‍රදේශ (2) සබරගමු පළාතේ ප්‍රදේශ
(3) දකුණේ මුහුදුබඩ ප්‍රදේශ (4) මීගමුව දූව ප්‍රදේශ

37. පෙරදිග සංගීතයේ භාවිතා වන ශුද්ධ කෝමල තීව්‍ර යන ස්වර වලට අපරදිග සංගීතයේ දී භාවිතා වන නම් පිළිවෙලින්,
(1) නැචුරල්, ෆ්ලැට්, ෂාප් (2) ෆ්ලැට්, නැචුරල්, ෂාප්
(3) ෂාප්, නැචුරල්, ෆ්ලැට් (4) ෂාප්, ෆ්ලැට්, නැචුරල්

38. ''රේඛාව'' චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂණය කළේ,
(1) බී.එස්. පෙරේරා (2) මොහොමඩ් ගවුස් (3) මුත්තුසාමි (4) රොක්සාමි

- **(සර්පිනාව,** වයලීනය, මැන්ඩලීනය, එස්රාජය, ගිටාරය, තබ්ලාව**)**

39. ඉහත සඳහන් සංගීත භාණ්ඩ අතර නොමැත්තේ,
(1) සුෂිර භාණ්ඩ ගනයට අයත් සංගීත භාණ්ඩයකි.
(2) තත් භාණ්ඩ ගනයට අයත් සංගීත භාණ්ඩයකි.
(3) ලය පවත්වා ගැනීමට සුදුසු සංගීත භාණ්ඩයකි.
(4) සමාඝාත ඝනයට අයත් සංගීත භාණ්ඩයකි.

40. ඉහත භාණ්ඩ අතරින් නියමිත ශ්‍රැතියකට සුසර කර ඇති භාණ්ඩය වනුයේ,
(1) සර්පිනාව (2) තබ්ලාව (3) ගිටාරය (4) එස්රාජය

(ලකුණු 40)

## II - කොටස

- **පළමු ප්‍රශ්නයඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

(01) i. |ග රි ස |නි රි ස |ප ම ග රි |ග |මේ ගීතය කුමන රාගයකට අයත් ද? (ල.01)
ii. කාෆි රාගයේ මුඛ්‍යාංගය ලියා දක්වන්න. (ල.01)
iii. ආර්. මුත්තුසාමි ශූරීන් විසින් සංගීතවත් කළ මාතලන් චිත්‍රපටයේ එන ජනප්‍රිය ගීතයක් නම් කරන්න. (ල.01)
iv. භීමපලාශ්‍රී රාගය ආශ්‍රිත සරල ගීතයක් නම් කරන්න. (ල.01)
v. නාදයේ ත්‍රිවිධ ගුණ නම් කරන්න. (ල.01)

vi. තබ්ලා වාදනයක අංග 02 ක් සඳහන් කරන්න. (ල.02)

vii. $B^{b}$ (B Flat) Major Scale ලියා දක්වන්න. (ල.01)

viii. හෙළ සිනමාවේ අද්විතීය නමක් දිනාගත් චිත්‍රපට ගීත රචකයින් දෙදෙනෙක් ලියා දක්වන්න. (ල.01)

ix. රාමායනය තූර්තියට අයත් ගීතයක් සඳහන් කරන්න. (ල.01)

x. සුළු තනි තිත ප්‍රස්තාර කරන්න. (ල.02)

(02) පහත දක්වෙනුයේ නිර්දේශිත රාග වලට අයත් මුඛ්‍යාංගයන් ය,

(a) ම ගු, ස රි ස, ධු නි ස (b) නි ධ, ම ප ධ, ම ග

(c) නි ස ම, ම ගු, ප ම් ගු රි ස (d) ස ධ, ස රි ග, ග ප ධ ප

i. ඉහත මුඛ්‍යාංග අයත් රාග නම් කරන්න. (ල.02)

ii. කොටසට අයත් රාගයේ සර්ගමය ලියා දක්වන්න. (ල.02)

iii. (a), (d)කොටසට අයත් රාග සඳහා ස්වර අභ්‍යාස 02 ක් වෙන වෙනම ලියා දක්වන්න. (ල.04)

iv. (c) කොටසට අයත් රාගයේ මධ්‍යලය ගීතයේ අන්තරා කොටස ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල.04)

(03) ධින්න ධිනක | තින්න ධිනක

i. ඉහත තාලය නම් කර තාල සංඥා හා මාත්‍රා සඳහන් කරන්න. (ල.02)

ii. ඉහත තාලයට ගැලපෙන ගීතයක මුල් කොටස තාලයට අනුව ප්‍රස්තාර කරන්න. (ල.04)

iii. තනි තිතෙහි ප්‍රභේද නම් කර ඒවා ප්‍රස්තාර කරන්න. (ල.06)

(04) පහත දක්වෙන ගීත පාද ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| A | B | C |
|---|---|---|
| කෝකිලයන්ගේ කෝකිල නාදේ<br>කුරුළු ගමේ කුරුළු ගෙදර | ශ්‍රී රාහුල හිමිගේ ......<br>පිට දීප දේශ ජයගන්නා<br>මුනි නන්දන සිරිපාද වඳිමි | රස ආහාර කවලා<br>මී වදයකි ජීවිතේ<br>රෝසා පොල්ල ගෙනෙන් |

i. ඉහත A, B, C කොටස් වලට අයත් ගී විශේෂ වෙන වෙනම හඳුන්වන්න.

ii. එම කොටස් 03 ට අයත් ගායන විශේෂ වල විශේෂ ලක්ෂණ 03 බැගින් සඳහන් කරන්න.

iii. ගී වර්ග 03 ට අයත් ගීත 03 ක මුල් කොටස් ලියා දක්වන්න.


iv. B කොටසට අයත් ගායන විශේෂය සඳහා දායකත්වය ලබා දුන් සංගීතඥයින් දෙදෙනෙක් සඳහන් කරන්න. (ල.12)

(05) i. ඔබ උගත් වන්නම් ඇසුරෙන් පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න. (ල.07)

| | තානම | වන්නමෙහි නම | සම්ප්‍රදාය | යොදාගන්නා වාද්‍ය භාණ්ඩය | විශේෂ ලක්ෂණ 03 ක් |
|---|---|---|---|---|---|
| a | තෙනතෙනි තෙන තෙනින නා තෙනම් තෙන | | | | 1 ................. |
| b | තානා තනෙන තනම් | | | | 2 ................. |
| c | තාන තනාතන තනෙනා තෙතන තනා තන තනෙනා | | | | 3 ................. |

ii. ඉහත a, b, c යන වන්නම් වල මුල් කවිය ලියා දක්වන්න. (ල.05)

(06)



i. ඉහත බටහිර ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරන්න. (ල.04)

ii. ඉහත ප්‍රස්තාරයට ගැලපෙන Time Signature යොදන්න. (ල.02)

iii. එම ප්‍රස්තාරය අයත් ස්කේලය නම් කරන්න. (ල.03)

iv. ඔබ පෙරදිග ක්‍රමයට පෙරලූ ප්‍රස්තාරය මධ්‍යම භාවයෙන් ලියා දක්වන්න. (ල.03)